සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 14 S I,II

නම: .............................................

**කතෝලික ධර්මය**

කාලය පැය තුනයි

සැලකිය යුතුයි-
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරනන්න..

01. මිනිස් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරී බව දේව වේදීය දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කරන්නේ,
1. ඉතිහාස පොත්වල ය.
2. ප්‍රඥා සාහිත්‍ය පොත්වල ය.
3. පංච පුස්තකයේ ය.
4. දිවැසිවර පොත්වල ය.

02. ''ස්වාමින් වහන්සේ වචනය සදහට ම පවතියි. මේ වචනය නම් ඔබට දේශනා කරන ලදසුබ අස්න ය'' මෙලෙස සඳහන් ශුද්ධ බයිබලීය ග්‍රන්ථය වන්නේ,
1. 1 ජොහාන් ය.
2. 2 ජොහාන් ය.
3. 1 පේදුරු ය.
4. 2 පේදුරු ය.

03. ලූක් ශුභාරංචියේ දෙවන කාණ්ඩය වන්නේ,
1. බාරුක් පොත ය.
2. ක්‍රියා පොත ය.
3. එළිදරව්ව පොත ය.
4. දානියෙල් පොත ය.

04. පහත සඳහන් ප්‍රකාශ අතරින් අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ග්‍රීසියේ ''අක්කායා'' නම් ස්ථානයේ දී රචනා කර ඇත.
2. ක්‍රි.ව. 80-85 අතර කාලයේ රචනා කර ඇත.
3. නව ගිවිසුමේ පොත් වර්ගීකරණයේ වෙනත් හසුන් කාණ්ඩයට අයත් වේ.
4. පාවුලුතුමා වෙත පිළිගන්වා ඇත.

05. පාවුලුතුමා විසින් කිතුනු උපදෙස් දීම සඳහා ලියූ ලිපි මගින් පැහැදිලි වන්නේ,
1. පාවුලුතුමාගේ ධර්මදූත චාරිකාවල අරමුණු ය.
2. පාවුලුතුමාගේ ලේඛන හා තර්කන හැකියාව ය.
3. පාවුලුතුමාට ව්‍යවස්ථාව හා නීතිය පිළිබඳව තිබූ හසල දැනුම ය.
4. පාවුලුතුමාගේ නායකත්වයේ ස්වභාව ය.

06. ක්‍රිස්තු භක්තිකයින්ට විශ්වාසයේ ස්ථිරව සිටින ලෙස දන්වා යැවූ ලිපිය වනුයේ,
1. කොලොස්සි ලිපිය යි.
2. හේබ්‍රෙව් ලිපිය යි.
3. පිලිප්පි ලිපිය යි.
4. පිලමොන් ලිපය යි.

07. දේව ආදරයේ හා ක්‍රිස්තුස් වහන්සේගේ කීකරුකමේ සංකේතය කුරුසය බව සඳහන් සංදේශ ද්විත්වය වන්නේ,
1. රෝම හා එපීස ය.
2. රෝම හා පිලිප්පි ය.
3. පිලිප්පි හා ගලාති.
4. ගලාති හා එපීස ය.

08. වර්තමානයේ කරදර, දුක්පීඩා ඉවසා දරා ගැනීමට අපට ආරාධනා කරන්නේ,
1. ද්විත්වවාදය යි.
2. ප්‍රඥාව යි.
3. පරිපූර්ණත්වය යි.
4. යුගාන්තවාදය යි.

09. ''හොඳ නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඔබේ දාසයාට දුන් මැනව'' යි සලමොන් රජතුමා දෙවියන් වහන්සේගෙන් අයැද සිටියේ,
1.ජෙරුසලමේදී ය.
2. ගිබියොන්හිදී ට.
3. බෙතෙල්හිදී ය.
4. පෙනුයෙල්හිදී ය.

10. ශුද්ධාත්ම දීමානවක් වන ප්‍රඥාව ලබා ගැනීමට අප කළ යුත්තේ,
1. දිනපතා විශ්වාසයෙන් යාච්ඤා කිරීම ය.
2. යහපත හා අයහපත හඳුනාගෙන දිවි ගෙවීම ය.
3. බුද්ධිය වර්ධනය කර ගැනීම ය.
4. දැනුම යාවත්කාලීන කරගැනීම ය.

11. පේදුරුතුමා ජේසුස් වහන්සේ පසුපසින් ....................................................දක්වා ගියේය. මෙහි හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වන්නේ,
1. ජෙරුසලම් දෙව්මැදුර
2. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය.
3. උත්තම පූජක මැදුර.
4. පිලාත්ගේ මාළිගය.

12. A - වස්ත්‍ර බෙදා ගැනීමට දාදු දැමීම. B - හිරු ඇඳුරු වීම.
C - දේව මාළිගාවේ තිරය දෙකඩව ඉරී යාම. D - දේව මාළිගාවේ අත්තිවාරම සෙලවීම.
ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ සිදු වූ සිදුවීම් පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,
1. A හා B ය. 2. A හා C ය. 3. B හා D ය. 4. B හා C ය.

13. අරමාතියේ ජෝසෙප් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කළ සේවය වන්නේ,
1. කුරුසය ගෙන යාමට සහාය වීම ය. 2. උත්ථානයට සාක්ෂි දැරීම ය.
3. ජේසුස් වහන්සේගේ පාද සේදීම ය. 4. භූමදාන කටයුතු සිදුකිරීම ය.

14. පාස්කුවෙන් පසු ජුදා ආගමිකයින්ගේ ප්‍රධාන මංගල්‍යය වූයේ,
1. පෙන්තකොස්ත මංගල්‍යය ය. 2. කූඩාරම් මංගල්‍යය ය.
2. පසුකර යාමේ මංගල්‍යය ය. 4. පවිත්‍රකමාවේ මංගල්‍යය ය.

15. පෙන්තකොස්ත දින පේදුරුතුමා අන්‍ය භාෂා කතාකරනු අසා සියල්ලෝ පුදුමයට පත්වූයේ,
1. ඔහු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙක් ව සිටි බැවිනි. 2. ඔහු නූගත් යැයි සම්මත වූ ගලීල වැසියකු වූ බැවිනි.
3. ඔහු ධීවරයෙක් ව සිටි බැවිනි. 4. ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව සිටි බැවිනි.

16. සුබ අස්න දේශනා කළ උපස්ථායකයෙක් වන්නේ,
1. තීතස් ය. 2. ප්‍රකෝරස් ය. 3. පාවුලු ය. 4. ස්තේපන් ය.

17. ශුද්ධ වූ පාවුළුතුමා රෝම අධිරාජ්‍ය තුළ විශේෂ වරප්‍රසාදවලට හිමිකරුවෙකු වූයේ,
1. ගමාලියෙල් යටතේ අධ්‍යාපනය ලැබූ නිසා ය. 2. බෙන්ජමින් ගෝත්‍රයට අයත් වූ නිසා ය.
3. පියාගේ රෝම පුරවැසිභාවය නිසා ය. 4. තාර්සස්හි උපත ලැබූ නිසා ය.

18. ශුද්ධ වූ පාවුලතුමා සමඟ දෙවන ධර්මදූත චාරිකාව සඳහා සහභාගී වූවන් ඇතුළත් පිළිතුර වන්නේ,
1. තිමොතියස්තුමා හා ලූක් තුමා ය. 2. මාක් තුමා හා බර්ණබස් තුමා ය.
3. සීලස් තුමා හා මාක් තුමා ය. 4. ලූක් තුමා හා මාක් තුමා ය.

19. පාවුලුතුමාට දේව මාළිගාවේදී අත්අඩංගුවට ගැනීම සඳහා චෝදනා ඉදිරිපත් කරන ලද්දේ,
1. පලස්තීනයෙන් පැමිණි ජුදෙව්වරු විසින් ය. 2. ආසියවෙන් පැමිණි ජුදෙව්වරු විසින් ය.
2. සිරියාවෙන් පැමිණි ජුදෙව්වරු විසින් ය. 4. රෝමයෙන් පැමිණි ජුදෙව්වරු විසින් ය.

20. ජේසුස් වහන්සේ අනුගාමී වූ සෙබදිගේ පුතුන් දෙදෙනා වන්නේ,
1. පේදුරු හා ඇන්ඩෘ ය. 2. පේදුරු හා ජාකොබ් ය.
3. ජොහාන් හා ජාකොබ් ය. 4. ජොහාන් හා පේදුරු ය.

21. ''මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි..'' මෙහි ''පර්වතය'' යන්නෙන් අදහස් කරන්නේ,
1. ශුද්ධ වූ පාවුලුතුමා ය. 2. ශුද්ධ වූ පේදුරු තුමාය.
3. ගොල්ගොතා කඳු මුදුන ය. 4. තාබෝර් කඳු මුදුන ය.

22. ශුද්ධෝත්තම පියතුමා අන් සියලු රාජගුරුප්‍රසාදීන්ට වඩා උසස් වනුයේ,
1. එතුමා සතු බලයෙන් හා අධිකාරිත්වයෙන් ය. 2. ඉගැන්වීම්වලින් හා අධිකාරිත්වයෙන් ය.
3. එතුමා සතු ධූරයෙන් හා ගෞරවයෙන් ය. 4. එතුමා සතු බලයෙන් හා ගෞරවයෙන් ය.

23. ශුද්ධ වූ සභාවේ ඒකත්වය වෙනුවෙන් අපට කළ හැකි කාර්යයක් වන්නේ,
1. අපගේ පව්වලට දුක් මනස්ථාප වෙමින්, සමාව ලබාගෙන ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීම ය.
2. අන් ප්‍රධාන කිතුනු සභා සමග සමගියෙන් හා සහයෝගයෙන් කටයුතු කිරීම ය.
3. සුභාරංචිය සියලු දෙනා වෙත ගෙන යමින් ධර්මදානයේ යෙදීම ය.
4. අපෝස්තුලුවරුන්ගෙන් ලැබී ඇති සියල්ල කෙරෙහි විශ්වාසවන්තව කටයුතු කිරීම ය.

24. අපෝස්තුලුවරුන් හා වත්මන් ශුද්ධ වූ සභාව අතර දූත කාර්යයේ අනන්‍යතාවය වන්නේ,
1. ශුද්ධත්වය යි. 2. ඒකත්වය යි. 3. කතෝලිකත්වය යි. 4. අපෝස්තලිකත්වය යි.

25. එකම ශුද්ධ වූ කතෝලික හා අපෝස්තලික සභාවේ පේදුරුතුමාගේ අනුප්‍රාප්තිකයින් විසින් පාලනය කරන බවට සඳහන් වන්නේ,
1. ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශනයේ ය. 2. ''සත්‍යය'' නමැති ලිපියෙහි ය.
3. ජාතීන්ගේ අලෝකය පිළිබඳ ප්‍රකාශනයේ ය. 4. බලාපොරොත්තුවේ එළිපත්ත යන ප්‍රකාශනයේ ය.

26. පෘතුගීසි සමයේ මෙරටට පැමිණි ධර්මදූත කණ්ඩායම්වල විශේෂ අවධානයක් යොමු වූයේ,
1. දහම් ප්‍රචාරයට ය. 2. දයා සේවවාට ය. 3. අධ්‍යාපනයට ය. 4. යාච්ඤාවේ ජීවිතයට ය.

27. A - ක්‍රි.ව. 1705 දී ශ්‍රී ලංකාවේ සේවයට පැමිණියේ ය.
B - හිස් පතුලෙන් සේවයට කැප විය.
C- දේශීය කිතුනු සාහිත්‍යයක් ගොඩනැගීමට පුරෝගාමී විය.
D - අන්නාවි, මුහුප්පු, සන්ක්‍රිස්තියන් යනාදී ගිහි නායකයින් පත් කෙරිණි.
E - පූජක දිවියෙන් වසර 24 ක් ම ලංකාවේ සේවය කර ඇත
ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාට අයත් සත්‍යය තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.
1. ACD ය. 2. BCE ය. 3. BDE ය. 4. ABD ය.

28. වර්මානය වන විට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රදගුරු පදවි සංඛ්‍යාව වන්නේ,
1. 11 ක් ය. 2. 12 ක් ය. 3. 13 ක් ය. 4. 14 ක් ය.

29. ''මාගේ මාංසය අනුභව කරන මාගේ රුධිරය පානය කරන තැනැත්තේ මා තුළ ජීවත් වන්නේ ය.මම ද ඔහු තුළ ජීවත් වන්නෙමි'' මෙම බයිබල් පාඨයෙන් කියවෙන දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණය වන්නේ,
1. භෝජනයක්. 2. යාගයක්. 3. ගිවිසුමක්. 4. ස්තුති කිරීමක්.

30. ''මාංසය'' හා ''රුධිරය'' යනුවෙන් අදහස් කරනුයේ,
1. පූපය හා මිදිරසයි.
2. ජේසුතුමාව අප ලබා ගන්නා ආකාරය යි.
3. අන්තිම රාත්‍රී භෝජනයේ දී සිදුකළ ප්‍රාතිහාර්ය යි.
4. සක්‍රමේන්තුමය ලෙස ලැබෙන දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය යි.

31. දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමකර හෝ තැන්පත් කර ඇති අවස්ථාවල දී යාච්ඤා කිරීම තුළින්,
1. දේව සබඳතාව වර්ධනය වෙයි. 2. අපගේ අවශ්‍යතා කඩිනමින් ලබා දෙයි.
3. වරප්‍රසාද බහුලව ගලා එයි. 4. නිවැරදි සංවාදයකට ඇතුල්වෙයි.

32. දෙවියන් වහන්සේ විසින් මෝසෙස්තුමාගේ සහය පිණිස යවන ලද්දේ,
1. ජෝෂුවා ය. 2. මිරියම් ය. 3. ආරොන් ය. 4. ජෝනා ය.

33. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගී වන අප විසින් කළ යුතු දෙයකි,
1. ප්‍රේමයේ පනත ජීවත් කරවීම. 2. ක්‍රිස්තු ප්‍රතිපත්ති චරිතායනය කිරීම.
3. භාග්‍ය අට ක්‍රියාවට නැංවීම. 4. දස පනත අනුසාර කිරීම.

34. ශුද්ධ වූ ජොහාන්තුමා පෙන්වා දෙන ආකාරයට දිව්‍ය පූජාවේ යථාර්ථය වන්නේ,
1. බෙදාගැනීමේ හා එකමුතුවීමේ භෝජනය ලබා ගැනීම ය.
2. ප්‍රේමය හා සේවය ක්‍රියාවට නැංවීම ය.
3. පාපයට සමාව ලබා පෞද්ගලික ශුද්ධත්වය සඳහා වෙහෙසීමය .
4. දුකෙන් මිදී සුවබර දිවියක් ගතකිරීම ය.

35. පුරාණ ගිවිසුමේ යාග පූජා පිළිබඳව සඳහන් කෙරෙන ග්‍රන්ථය වන්නේ,
1. නික්මයාම ය. 2. ද්විතීය නීති සංග්‍රහය ය. 3. ගණන් කතාව ය. 4. ලෙවී ව්‍යවස්ථාව ය.

36. අත්‍යන්තවූ ද අපරිමිතවූ සදාතනවූ ද අමිල යාගය වන්නේ,
1. දවන පූජා යාගය යි. 2. පාප පූජා යාගය යි. 3. කල්වාරි පූජා යාගය යි. 4. සාම පූජා යාගය යි.

37. ජාතීන්ගේ විනිශ්චය දිනයේ ක්‍රිස්තුස් වහන්සේ යොදා ගන්නා මිනුම් දණ්ඩ වන්නේ,
1. ආත්මික පුණ්‍යය ක්‍රියා ය. 2. ශාරීරික පුණ්‍යය ක්‍රියා ය. 3. දානමය පුණ්‍යය ක්‍රියා ය. 4. සාමූහික පුණ්‍යය ක්‍රියා ය.

38. භාෂා හතළිහකට පමණ පරිවර්තනය වී ඇති ''බලාපොරොත්තුවේ එළිපත්ත'' කෘතිය රචනා කරන ලද්දේ,
1. ගරු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා ය. 2. ගරු. මයිකල් රොද්‍රිගු පියතුමා ය.
3. ශුද්ධ වූ තෙරේසා මව්තුමිය යි. 4. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ය.

39. තෙරේසා මව්තුමිය ඇතුළු වූ පැවිදි නිකාය වන්නේ,
1. ලොරෙටෝ පැවිදි නිකාය.. 2. ශුද්ධ වූ පවුලේ පැවිදි නිකාය.
3. දයාවේ දූතිකාවෝ පැවිදි නිකාය. 4. කොන්ෂුවල් පැවිදි නිකාය.

40. යාච්ඤාවෙ හා පශ්චත්තාපික ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග පරාජය කිරීමේ අරමුණින් ආරම්භ කළ සංවිධානයක් වන්නේ,
1. මරිය හමුදාව. 2. ගැලවීමේ හමුදාව.
3. මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව. 4. ජේසුතුමන්ගේ ශ්‍රී හෘදයේ හමුදාව.

ii කොටස

● පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. 1. දේව අනාවරණයේ මූලාශ්‍ර දෙක නම් කරන්න.
2. නව ගිවිසුමේ වෙනත් හසුන් ලියූ කතුවරුන් දෙදෙනෙක් නම් කරන්න.
3. එළිදරව් සාහිත්‍යයේ එන 4 හා 10 සංඛ්‍යාවල සංකේත ලියන්න.
4. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
5. උත්ථාන වූ ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනය වූ අවස්ථා දෙක්ක ලියන්න.
6. උපස්ථායකයින් පත්කර ගැනීමේදී සලකා බැලූ කරුණු දෙකක් ලියන්න.
7. ශුද්ධ වූ පාවුලුතුමාගේ ප්‍රසාද ස්නාපනයට සම්බන්ධ වූ පුද්ගලයා හා නගරය ලියන්න.
8. ජේදුරුතුමාගෙන් පසු ශුද්ධ වූ සභාවේ නායකත්වයට පත් වූ දෘෂ්‍යමාන නායකයා හැඳින්වීමට යොදන නම් දෙකක් සඳහන් කරන්න.
9. බ්‍රිතාන්‍යය යුගයේ මෙරටට පැමිණි කාන්තා පැවිදි නිකායයන්.
10. ශුද්ධ වූ තෙරේසා මව්තුමිය උපත ලැබූ රට හා සේවය කළ රට නම් කරන්න.

02.1. ශුද්ධ වූ පාවුලුතුමා ලිපි ලියා ඇති කාණ්ඩ දෙක නම් කරන්න.
2. ශුද්ධ වූ පාවුලුතුමාගේ සන්දේශ වර්ගීකරණයේ කොටස් තුන නම් කරන්න.
3. පාසල් දරුවන් ලෙස දෙවිඳුන්ට ප්‍රසන්න ජීවිත ගතකිරීමට ඔබට කළ හැකි දේවල් පහක් විස්තර කරන්න.

03.1. ආණ්ඩුකාර පිලාත් වෙත රැගෙන ගිය ජේසුස් වහන්සේට එල්ල වූ චෝදනා දෙකක් ලියන්න.
2. ක්‍රිස්තුස් වහන්සේ කුරුස ගසේදී වදාළ ප්‍රකාශ තුනක් ලියන්න.
3. සතුරාට ප්‍රේමකළ ක්‍රිස්තුස් වහන්සේ ආදර්ශයට ගනිමින් අසල්වැසියාට ප්‍රේම කිරීමට ඔබට කළ හැකි කාර්‍යයන් පහක් විස්තර කරන්න.

04.1. පෙන්තකොස්ත දිනයේ සිදු වූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.
2. ශුද්ධාත්ම ආගමනයෙන් පසු ඇති වූ වෙනස්කම් තුනක් ලියන්න.
3. ක්‍රිස්තු ශ්‍රාවකයෙක් ලෙස උත්වහනසේ පිළිබඳ සුභාරංචිය අන් අය වෙත ගෙන යාම සඳහා ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියා විස්තර කරන්න.

05. 1. ශ්‍රී ලංකා ශුද්ධ වූ සභා ඉතිහාසයට අයත් යුග දෙකක් සඳහන් කරන්න.
2. ලන්දේසීන් මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ එම ප්‍රදේශවල කිතුනුවන්ට එල්ලා වූ බාධක තුනක් ලියන්න.
3. සැබෑ කිතුනු අනුගාමිකයෙක් ලෙස ඔබේ පන්ති කාමරය තුළ ක්‍රිස්තුස් වහන්සේව ජීවමාන කරවන ආකාර පහක් විස්තර කරන්න.

06. 1. දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් සඳහන් කරන්න.
2. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු තුනක් ලියන්න.
3. ජීවමාන ක්‍රිස්තුස් වහන්සේගෙන් පෝෂණය වූ ඔබ ක්‍රිස්තු ප්‍රේමය ලොවට ප්‍රකාශ කරන ආකාර පහක් විස්තර දක්වන්න.

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
1. ප්‍රඥා සාහිත්‍යය. 2. එළිදරව් සාහිත්‍යය.
3. ශු. මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා. 4. ගරු. මයිකල් රුදිගු පියතුමා.